# ශ්‍රී ලංකාවේ අලියා පිළිබඳ අධ්‍යයනයක් ඃ ශිලාලේඛන හා කාසි ඇසුරෙන්

**නිලන්ති බණ්ඩාර ***

සත්ත්ව ලෝකයේ අලියාට හිමිවන්නේ වැදගත් තැනකි. ඊට හේතුව ඔහු තේජවන්ත, බලසම්පන්න සහ ඥාණවන්ත සතෙකුවීමයි. ශ්‍රී ලංකීක සමාජයේද අලියා ගෞරවනීය සත්ත්වයෙකු ලෙස සැලකේ. බෞද්ධ සමාජයේද අලියාට සුවිශේෂත්වයක් හිමිවෙයි. අතීතයේ මෙන්ම නූතනයේ ද අලියාගේ වටිනාකම එකසේ නොනැසී පවතී. මෙවැනි වැදගත්කමක් හිමි වූ අලියා පිළිබඳ මෙන් ම අලියා කෙරෙහි පැවති ආකල්පය කෙසේද යන්න හෙළිකිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වෙයි.

මෙම අධ්‍යයනයේදී අවධානය යොමුවූයේ මුල් යුගයේ සිට අනුරාධපුර යුගය දක්වා ශිලාලේඛන සහ මෙරට භාවිතා වූ පුරාණ කාසි ය.

ශිලාලේඛනවල අලින් මෙන්ම ඇත් දළ පිළිබඳ, හස්තින් පුරුදු පුහුණු කළ ආචාර්යවරු, අධ්‍යක්‍ෂවරුන්, අලියා නමින් නම් කළ වැව්, ඇළවල්, ගම්, නගර සහ නුවරවල් ආදී මෙන්ම ඇත්දත් කැටයම් ශිල්පීන් ආදී බොහෝ තොරතුරු දැක්වෙයි. එමෙන් ම දේශීය කාසි අතර බෞද්ධ ස්වස්තික කාසියේ සහ ලක්ෂ්මී කාසියෙහි ද අලියාගේ සංකේත යොදාගත් බව පෙනේ. මීට අමතරව ඉංග්‍රීසින්ගේ කාසිවල ශ්‍රී ලංකාව වෙනුවෙන් නිකුත් කළ තඹ කාසි වූ තුට්ටු, පතාග, පනම් කාසිවල අභිමුඛයේ හෝ ප්‍රතිමුඛයේ ප්‍රධාන සටහන ලෙස යොදාගන ඇත්තේ ද අලියාගේ සටහනයි. බ්‍රිතාන්‍යයින් පවා මෙරට භාවිතය සඳහා නිකුත් කළ කාසිවල අලියා යොදාගත්තේ දේශීය අනන්‍යතාවය, ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ප්‍රධාන වෙළෙඳ භාණ්ඩයක් වීම නිසා යැයි පෙනේ. මෙවැනි සාධකවලින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකීය සමාජයේ අලියාට වැදගත් තැනක් හිමිවූ බවයි.

මුඛ්‍ය පදඃ අලියා, ශිලාලේඛන, කාසි, පුරාවිද්‍යාත්මක සාධක

*** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**